# බලහත්කාර විවාහයන් යනු කුමක්ද?



# ඇතුලාන්තය


බලහත්කාර විවාහයන් යනු කුමක්ද? 4

මට කළ හැක්කේ කුමක්ද? 6

ඔබ තනිවී නැත 8

නීති අසන පැන 14

උදව් සහ සහය 18

# බලහත්කාර විවාහයන් යනු කුමක්ද?

**ඕනෑම අයෙක් විවාහයට පෙළඹවීමට ලක්විය හැකිය - මෙයට සියලුම වයස්වල, ලිංගික තත්ව වල, ජනවාර්ගික හා ආගම්වල අය සිටිය හැක.**

බලහත්කාර විවාහයක් යනු එක් අයෙකු හෝ දෙදෙනාම විවාහයට කැමැත්ත නොදක්වන හෝ දැක්වීමට නොහැකි අවස්ථාවක ඔවුන් විවාහ කිරීම සඳහා පීඩනය හෝ අපයෝජනය භාවිතා කිරීමයි. පීඩනයක් හෝ අපයෝජනයක් නොමැති වුව ද, වයස අවුරුදු 18 ට පෙර යමෙකු විවාහ කර දීමට යමක් කිරීමෙන් ද බලහත්කාර විවාහයක් සිදු වේ.

බලහත්කාර විවාහය එක්සත් රාජධානියේ නීති විරෝධීය. එය එක්තරා ආකාරයක ගෘහස්ථ අපයෝජනයක් මෙන්ම බරපතල මානව හිමිකම් උල්ලංඝනයකි.

**කෙනෙක්ව විවාහයට බලකිරීම සෑමවිටම කායික නොවේ, නමුත් සෑමවිටම එය නීති විරෝධීය.**

කෙනෙක්ට විවාහයට බලකිරීමේ පීඩනය විවිධ ආකාරවලින් තිබිය හැකිය:

- **කායික පීඩනය** තර්ජන හෝ හිංසනය ලෙස සිදුවිය හැකිය (ලිංගික හිංසනයන් ද අදාල වේ)
- **චිත්තවේගීය හෝ මානසික පීඩනය** තමන් තම පවුලට ලැජ්ජාවක් ගෙන දෙන බව යමෙකුට හැඟීම ඇති කිරීම, ඔවුන් විවාහ නොවන්නේ නම් තම සමීපතමයන්

රෝගාබාධවලට ගොදුරු විය හැකි බවට ඔවුන් විශ්වාස කිරීම හෝ විවාහයට එකඟ නොවන්නේ නම් ඔවුන්ට නිදහස හෝ මුදල් ලබා නොදීම වැනි ස්වරූපයක් ගත හැකිය.

නමුත් විවාහ වීමට නියමිත පුද්ගලයා වයස අවුරුදු 18 ට අඩු වූ විට, ඔවුන් විවාහ කර දීමට ඕනෑම දෙයක් කිරීම අපරාධයකි - එයට බලපෑමක් කිරීම අවශ්‍යම නැත.

සමහර අවස්ථාවල දී විවාහ වීමට නියමිත බව නොදැන පුද්ගලයන් විදේශවලට රැගෙන යා හැකිය. ඔවුන් එම රටට පැමිණි විට, ඔවුන් නැවත එක්සත් රාජධානියට පැමිණීම වැළැක්වීමට උත්සාහ කිරීම සඳහා ඔවුන්ගේ විදේශ ගමන් බලපත්‍ර(ය)/ සංචාරක ලියකියවිලි රඳවා තබා ගත හැකිය.

## එකඟතා ප්‍රකාශය යනු කුමක්ද?

විවාහයක සම්මුතියක් ඇති වීමට නම්, විවාහ වන දෙදෙනාම ඊට නිදහසේ ඇතුළත් විය යුතුය. ඔබට තීරණයක් ගත හැකි ලෙස දැනිය යුතුය.

නීත්‍යානුකූලව, ඇතැම් ඉගෙනීමේ දුර්වලතා හෝ දැඩි මානසික සෞඛ්‍ය තත්වයන් ඇති පුද්ගලයින්ට විවාහය තමන්ට අවශ්‍ය දේ යැයි හැඟුණත් විවාහයට එකඟ විය නොහැක.

## සූදානම් කළ විවාහයක් යනු කුමක්ද?

වැඩිහිටියන්ගේ විවාහ සම්බන්ධයෙන් ගත් කළ, යෝජිත විවාහයක් බලහත්කාරයෙන් සිදු කරන විවාහයකට සමාන නොවේ. යෝජිත විවාහයක දී, විවාහ සහකරු තෝරා ගැනීමේ දී පවුල ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරන නමුත් විවාහයට ඇතුළත් වීමට අවශ්‍ය ද යන්න තෝරා ගැනීමේ නිදහස දෙදෙනාටම තිබේ.

(18 දක්වා) දරුවන්ගේ විවාහ සම්බන්ධයෙන් ගත් කල, යෝජිත විවාහ සහ බලහත්කාර විවාහ අතර වෙනසක් නොමැත. දරුවෙකු විවාහ කර දීමට ඕනෑම දෙයක් කිරීම බලහත්කාර විවාහයකි - එමෙන්ම අපරාධයකි.

**ඔබ විවාහ වීමට එකඟ වන්නේ නම්, නමුත් පසුව ඔබේ අදහස වෙනස් කර ගන්නේ නම් - එහෙත් තවමත් ඔබට විවාහය සමඟ ඉදිරියට යා යුතු යැයි හැඟේ නම් - එය ද බලහත්කාර විවාහයකි.**

# මට කළ හැක්කේ කුමක්ද?

ඔබට ක්ෂණික අනතුරක් ඇත්නම් 999 අංකයෙන් පොලීසිය අමතන්න.

ඔබ හෝ ඔබ දන්නා කෙනෙකු එක්සත් රාජධානියේ හෝ විදේශයකදී බලහත්කාරයෙන් විවාහ වීමට බල කරන්නේ නම්, බලහත්කාර විවාහ ඒකකය අමතන්න.

## බලහත්කාර විවාහ ඒකකය යනු කුමක්ද?

බලහත්කාර විවාහ ඒකකය වින්දිතයින්, අවදානමට ලක්වූවන් සහ වෘත්තිකයින් සඳහා සහාය සහ උපදෙස් සපයයි.

ඔබ පොලිසියට වාර්තා කිරීමට පෙර සහ පසුව බලහත්කාර විවාහ ඒකකයට උපදෙස් සහ සහාය ලබා දිය හැකි අතර, ඔබ කිසිසේත් වාර්තා නොකිරීමට තීරණය කළහොත් ද ඔවුනට එසේ කළ හැකිය.
තොරතුරු සහ මගපෙන්වීම් ලබා දීමේ සිට විදෙස්ගත බ්‍රිතාන්‍ය ජාතික වින්දිතයින්ට එක්සත් රාජධානියට ආපසු යාමට උපකාර කිරීම දක්වා මෙම සහයෝගය ලබා දේ.

ක්‍රියාකාරීන් බලහත්කාර විවාහය හා සම්බන්ධ සංස්කෘතික, සමාජීය හා චිත්තවේගීය ගැටලු සමඟ කටයුතු කිරීමේදී අත්දැකීම් ඇති අයයි.

ජාතිකත්වය නොසලකා එක්සත් රාජධානියේ සිටින ඕනෑම කෙනෙකුට උපදෙස් හා සහාය ලබා දීමට බලහත්කාර විවාහ ඒකකයට (Forced Marriage Unit) පුළුවන. බ්‍රිතාන්‍ය ජාතිකයින්ට (ද්විත්ව පුරවැසියන් ඇතුළුව) සහ ඇතැම් තත්වයන් යටතේ පොදුරාජ්‍ය මණ්ඩලීයේ වැසියෙකුට කොන්සියුලර් සහාය ලබා දීමට විදේශවල, අපගේ බ්‍රිතාන්‍ය තානාපති කාර්යාල, මහ කොමසාරිස් කාර්යාල හා කොන්සල් කාර්යාලවලට හැකිය.

අමතන්න:
සඳුදා සිට සිකුරාදා දක්වා උදෑසන 9 සිට සවස 5 දක්වා
(+44) (0) 207 008 0151
ගෝලීය ප්‍රතිචාර මධ්‍යස්ථානය (වෙනත් වෙලාවලදී)
(+44) (0) 207 008 1500
ඊමේල්: FMU@fco.gov.uk



# ඔබ තනිවී නැත

විවාහයට බලපෑම් කළහොත් ඔබට හෝ ඔබ දන්නා කෙනෙකුට හුදකලා හැඟීම් ඇති වීම අසාමාන්‍ය දෙයක් නොවේ. නමුත් ඔබ සිටින්නේ තනිවම නොවේ. සෑම වසරකම, LGBTQ+ ප්‍රජාව ඇතුළුව, සියලුම වයස්වල, වාර්ගික සහ ආගම්වල ස්ත්‍රීන් සහ පිරිමින්ගෙන් සිය ගණනක් නඩු අපට වාර්තා වේ. තවමත්, බොහෝ අය තමන්ට සිදු වන දේ හෝ තමන් දන්නා කෙනෙකුට සිදු වෙමින් පවතින බව සිතිය හැකි දේ අපට වාර්තා නොකරති.

වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ආගම හෝ ජනවාර්ගිකත්වය නොසලකා ඕනෑම කෙනෙකුට බලහත්කාරයෙන් විවාහයක් සිදු විය හැකි බවත්, එය වාර්තා කිරීමෙන් ජීවිත බේරා ගත හැකි බවත් මෙම සැබෑ ජීවිත කතා වලින් පෙනී යයි. (ලබාදී ඇති නම් ඔවුන්ගේ සැබෑ නම් නොවේ.)

# අයිෂාගේ කතාව

"මට වයස 15 ක් හා මගේ GCSE අවසන් කරන්න සූදානමින් හිටියෙ මම මගේ වැඩිහිටි ඥාති සහෝදරයෙක් විවාහ කරන්න මගේ පියා මාව විදේශයකට යවන්න උත්සහ කරන බව දැනගනිද්දි. තාත්තා හැමවෙලේම තරහින් හිටිය වගේම මටයි අම්මටයි හැමවෙලේම පහරදෙනව. අම්මට ඕනිවුනේ නෑ මාව මේ තරම් පොඩි වයසෙන් විවාහ කරන්න, ඒත් එයා ඔහුට බෑ කියන්න බයවෙලා හිටියෙ. මම හිතුවේ තාත්තා මාව රට හැර යන්න පොළඹවා මගේ දුරකථනය මගෙන් ඉවතට ගනී කියා, එවිට මට කිසිවෙකුගෙන් උදව් ඉල්ලන්න බැහැ."

---

අයිෂා ඇයගේ පාසලේ ගුරුවරියකට මෙය පැවසුවා, ඇය බලහත්කාර විවාහ ඒකකයට කතාකලා. අයිෂාගේ තාත්තාට නිකුත්කළ බලහත්කාර විවාහ ආරක්ෂණ නියෝගයක් ලබා ගැනීම සඳහා බලහත්කාර විවාහ ඒකකය දරුවන්ගේ සමාජ සත්කාර සමඟ කටයුතු කළේය. අයිෂාගේ පියාට අයිෂා රටින් පිටතට ගෙනයාමට නොහැකි වූ නිසා සහ ඇය වෙනුවෙන් විදේශ ගමන් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කිරීමට නොහැකි වූ නිසා බලහත්කාරයෙන් විවාහ වීම මෙම නියෝගයෙන් වලක්වනු ලැබීය. අයිෂා නිවසේ රැඳී සිටීමට බිය වූ බැවින් තාවකාලිකව ආරක්ෂිත රැකවරණ ස්ථානයක් ලබා දෙන ලදී. අයිෂාගේ අම්මා දරුවන්ගේ සමාජ සත්කාර සමඟ වැඩ කළ අතර අයිෂාගේ පියා හැර යාමට සහාය විය. අයිෂා දැන් ඇගේ අම්මා සහ බාල සොහොයුරන් සමඟ ආරක්ෂිතව ජීවත් වන අතර ඇගේ GCSE අවසන් කිරීමට සමත් විය.

# සයිඩ්ගේ කතාව

“පවුලේ විවාහ මංගල්‍යයක් සඳහා මගේ දෙමාපියන් මාව පාකිස්තානයට ගෙන යන විට මට වයස අවුරුදු 25 යි. මම එහි ගිය විට මම දැනගත්තා විවාහ වන්නේ මම බව. මට අවශ්‍ය නොවූ නමුත් මගේ අම්මාට සෞඛ්‍ය ගැටලු රාශියක් ඇති අතර සෑම කෙනෙක්ම පැවසුවේ මම එය ප්‍රතික්ෂේප කිරීමෙන් ඇය තවදුරටත් රෝගාතුර වන බවයි.  දින ගණනාවක් විවාහ වීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසු මම අවසානයේදී එය අත්හැර දමා මගේ පවුලේ කැමැත්තට අවස්ථාව ලබා දුන්නෙමි. මම නැවත එක්සත් රාජධානියට පැමිණි විට, මම එය අමතක කර මගේ ජීවිතය සමඟ ඉදිරියට යාමට උත්සාහ කළෙමි. ඉන් අනතුරුව, බිරිඳගේ පවුලේ අය, ඇයව එක්සත් රාජධානියට ගෙන්වා ගැනීම සඳහා වීසා ඉල්ලුම් පත්‍රයක් සඳහා අයදුම් කරන ලෙස මට බලපෑම් කිරීමට පටන් ගත්තා. ඔවුන් මට කතා කර තර්ජනය කරනවා.”

---

සයිඩ් හැකි මුල් අවස්ථාවෙම බලහත්කාර විවාහ ඒකකයට කතා කළ අතර ඔහු අකමැත්තෙන් අනුග්‍රාහකයෙකු වූ බැවින් ඔහුට සහාය විය හැකි ආකාරය පැහැදිලි කිරීමට බලහත්කාර විවාහ ඒකකයට හැකි විය.

# කදීජාගේ කතාව

"මේක්-අප් දැමීම හෝ මගේ යාලුවන් සමඟ රෑ චනතුරු එළියෙ සිටීම නිසා මම ගෙදරදී ගොඩක් කරදරවල වැටුණා. මගේ අම්මා ඒකට කැමති වුනේ නෑ ඒ නිසා අපි නිතරම වාද කලා. මට වයස අවුරුදු 19 දී ඇය මට කිව්වා අපි සෝමාලියාවේ සිටින මගේ ආච්චිව බලන්න නිවාඩුවක් ගත කරනවා කියලා. මම එහි ගිය විට, මගේ අම්මා මාව බෝඩිම් පාසලකට දමා, හොඳ සෝමාලියානු දියණියක වීමට ඉගෙන ගන්නා තෙක් මට එහි නැවතී සිටිය යුතු බව පැවසුවා. ඇය මගේ විදේශ ගමන් බලපත්‍රය රැගෙන මාව එහි දමා ආවා. පාසල හරිම නරකයි. ඔවුන් අපට පහර දුන් අතර මට පිටව යාමට අවශ්‍ය නම් මට මුරකරුවෙකු විවාහ කර ගත යුතු බව පැවසුවා."

---

කදීජා රහසිගත දුරකථනයක් සඟවා තබා තිබුණි. සිදු වූ දේ ඇය තම පෙම්වතාට පැවසූ අතර ඔහු බලහත්කාර විවාහ ඒකකයට කතා කළේය. බලහත්කාර විවාහ ආරක්ෂණ නියෝගයක් ලබා ගැනීම සඳහා බලහත්කාර විවාහ ඒකකය එක්සත් රාජධානියේ පොලීසිය සමඟ කටයුතු කළ අතර එමගින් කදීජාගේ විදේශ ගමන් බලපත්‍රය ආපසු ලබා දෙන ලෙස කදීජාගේ මවට උපදෙස් දුන් අතර ඇයට පාසලෙන් පිටව ගොස් ඇගේ ගුවන් ගමන එක්සත් රාජධානියට වෙන් කරවා ගැනීමට අවසර දුන්නේය. කදීජා නැවත එක්සත් රාජධානියට පැමිණෙන විට කෙටිකාලීන ආරක්ෂිත නවාතැන් සොයා ගැනීමට බලහත්කාර විවාහ ඒකකය උදව් කළේය. ඇය මේ වන විට රැකවරණය ලබමින් සිටින අතර පවුලෙන් ස්වාධීනව තම ජීවිතය නැවත ගොඩනඟා ගැනීම සඳහා විශේෂඥ වෘත්තිකයන්ගේ සහාය ලබා ගනී. (මොගඩිෂු බ්‍රිතාන්‍ය තානාපති කාර්යාලය විසින් කොන්සියුලර් සේවා සපයන්නේ නැත. ඔබ සෝමාලියාවේ හෝ සෝමාලිලන්තයේ සිටී නම් ඔබට බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් නයිරෝබි හා සම්බන්ධ විය හැකිය.)



# මැන්ඩීප්ගේ කතාව

> ඊයේ රාත්‍රියේ, මගේ දෙමාපියන් මේ ග්‍රීෂ්ම සෘතුවේදී අප ඉන්දියාවට යන ගමන ගැනත්, එහි සිටින විට මගේ සහෝදර මැන්ඩීප් විවාහ වීමට ඔවුන් සැලසුම් කර ඇති අන්දම ගැනත් කතා කරන ආකාරය මට ඇසුණි. මගේ අම්මා කිව්වා එයාව බලාගන්න ඔවුන් වයස වැඩියි කියලා, ඒ නිසා ඔහුට බිරිඳක් සිටීම සුදුසු යැයි සිතුවා කියා. මැන්ඩීප් දැඩි ඉගෙනීමේ දුර්වලතාවයෙන් පෙළෙන අතර ඔහු මූලික කටයුතු සඳහා පවා අම්මා සහ තාත්තා මත රඳා සිටී. මම හිතන්නේ නැහැ ඔහු විවාහ වීම ගැන කිසිවක් තේරුම් ගනීවි කියා.

---

මැන්ඩීප්ගේ සහෝදරිය බලහත්කාර විවාහ ඒකකයට සම්බන්ධ වූයේ ඇගේ සහෝදරයාගේ තත්වය සහ ඔහුට සිදුවීමට යන දේ තේරුම් ගැනීමට ඔහුට ඇති හැකියාව පිළිබඳව ඉස්මතු කර දැක්වීමට ය. බලහත්කාර විවාහ ඒකකය විසින් තත්වය පැහැදිලි කරමින් දේශීය වැඩිහිටි සමාජ සත්කාර කණ්ඩායම වෙත යොමු කිරීමක් කළ අතර තොරතුරු මූලාශ්‍රය නිර්නාමිකව පවතින බව සහතික කරමින් මැන්ඩීප් සඳහා මානසික හැකියාවන් තක්සේරු කිරීම සම්පූර්ණ කළ හැකිදැයි විමසීය. මැන්ඩීප් ඒ වන විටත් ඉගෙනීමේ ආබාධිත කණ්ඩායමේ සහාය ලබාගෙන සිටියද ඉදිරි විවාහය ගැන ඔවුන් දැන සිටියේ නැත. තක්සේරුව තුළින්, ලිංගිකත්වය හා විවාහය සඳහා එකඟ වීමට ඔහුට හැකියාවක් නොමැති බව ඔවුහු සොයා ගත්හ. බලහත්කාර විවාහ ආරක්ෂණ නියෝගයක් ඇතුළුව බලහත්කාර විවාහ ඒකකයේ උපදෙස් මත ආරක්ෂණ සැලසුමක් සකස් කරන ලදී. ඉගෙනීමේ දුර්වලතා කණ්ඩායම පසුව පවුල සමඟ එක්ව මැන්ඩීප් විවාහ වීමේ අවදානම පැහැදිලි කිරීමට සහ ඔහුගේ දිගුකාලීන අවශ්‍යතා සඳහා වෙනත් විකල්ප ගවේෂණය කිරීමට කටයුතු කළේය.

# මැල්කම්ගේ කතාව

"මම සුසාන්. මැල්කම් මගේ තාත්තා. ඔහුට වයස අවුරුදු 75 ක් වන අතර පසුගිය වසර 5 තුළ ඇල්සයිමර් රෝගය වැළදී ඇති අතර ඔහුගේ ඩිමෙන්ශියාව දරුණු වේ. ඔහු ජීවත් වන ස්ථානය හෝ උදේ ආහාරය පිළියෙළ කරන්නේ කෙසේද වැනි මූලික දේ පවා ඔහුට මතක නැත. පසුගිය ග්‍රීෂ්ම ඍතුවේදී ඔහුගේ අසල්වැසි පැමලා මට පැවසුවා ඇය ඔවුන් වෙනුවෙන් නිවාඩුවක් වෙන්කරගෙන ඇති බවත් ඔවුන් ආදරයෙන් බැඳී සිටින බවත් ඔවුන් නැවත පැමිණෙන විට විවාහ වීමට සැලසුම් කර ඇති බවත් ය. මට ඒක විශ්වාසකරන්න බැරිවුනා. මම තාත්තාගෙන් තත්වය ගැන විමසූ විට ඔහුට ගමනක් සඳහා ඔව් යැයි පැවසීම මතක නැත, නමුත් නිවාඩුවක් හොඳයි කියා සිතුවා. මම විවාහය ගැන සඳහන් කළ විට, ඔහු තේරුම් ගත් බවක් පෙනුනෙ නෑ."

---

මෙය බලහත්කාර විවාහයක් ලෙස අර්ථ දක්වනු ඇතැයි සුසන්ට විශ්වාස නැති නිසා ඇය ඒ ගැන ඇසීමට බලහත්කාර විවාහ ඒකකයට කතා කළා. මැල්කම්ට විවාහයට එකඟ වීමට හැකියාවක් නොමැති නම් ඔහු විවාහ වීම සාපරාධී වරදක් බව ඔවුහු පැහැදිලි කළහ. වැඩිහිටි සමාජ සත්කාර මගින් හැකියා තක්සේරුවක් වහාම සිදු කරන ලදී. එයින් විවාහයට එකඟ වීමට මැල්කම්ට හැකියාවක් නොමැති බව තීරණය කළ අතර මෙය සිදුවීම වැළැක්වීමට පොලිසිය පියවර ගැනීමට තීරණය කරන ලදී.

# නීති අසන පැන

## මම බලහත්කාර විවාහ ඒකකයට කතාකළවිට කුමක් සිදුවේද?

පළපුරුදු සේවකයකු සමඟ ඔබ කථා කරනු ඇති අතර ඔබේ පෞද්ගලික තත්වයන්ට ගැලපෙන පරිදි ඔබට සහාය සහ තොරතුරු ලබා දෙනු ඇත. ඔවුන් ඔබේ අයිතිවාසිකම් සහ ඔබට ලබා ගත හැකි සේවාවන් පිළිබඳ තොරතුරු ලබා දෙනු ඇත. අපි ඔබගේ පවුල සම්බන්ධ කර නොගන්නෙමු.

## බලහත්කාර විවාහ ඒකකයට ලබාගන්නා ඇමතුම් නිර්ණාමික ද?

ඔබට අවශ්‍ය නම් ඔබට නිර්නාමිකව සිටිය හැකි නමුත් බලහත්කාර විවාහ ඒකකයට ලබා දිය හැකි සහයෝගය මෙමඟින් සීමා විය හැක, එබැවින් ඔවුන් බොහෝ විට ඔබේ වයස, ස්ථානය සහ ජාතිකත්වය වැනි විස්තර අසනු ඇත. ඔබ අප සමඟ බෙදාගන්නා ඕනෑම තොරතුරක් ඔබ වයස අවුරුදු 18 ට අඩු නම් හෝ හානියක් වීමේ ආසන්න අවදානමක් නොමැති නම් රහසිගතව සලකනු ලැබේ.

## ඔබට මගේ ආරක්ෂිතබව සහතික කළ හැකිද?

ඔබගේ ආරක්ෂාව අපට සහතික කළ නොහැකි අතර, ඔබව ආරක්ෂා කිරීමට උදව් කළ හැකි ආයතන සමඟ අපට ඔබව සම්බන්ධ කර දිය හැකිය. ඔබට ක්ෂණික අනතුරක් ඇත්නම් ඔබ සැමවිටම 999 අංකයට පොලීසිය අමතන්න.

## මම නිවසින් පිටවීමට තීරණය කළහොත් මා කළ යුත්තේ කුමක්ද?

බලහත්කාර විවාහයට ගොදුරු වූවන්ට සරණාගත ස්ථානයක ආරක්ෂිත නවාතැන් පහසුකම් ලබා ගත හැකි අතර විවිධ පසුබිම්වල පුද්ගලයන් සඳහා විශේෂඥ සේවාවන් තිබේ. සරණාගත ස්ථානය නිදාගැනීමට ඇති තැනකට වඩා ස්ථානයකි. විශේෂඥ කාර්ය මණ්ඩලය ඔබට නව ජීවිතයක් ආරම්භ කිරීමට අවශ්‍ය සියලුම දේවල් ලබා දෙනු ඇත.

## මම විදේශයක සිට පලායෑමට සමත් වී, මට නිවස කරා පියාසර කිරීමට ප්‍රමාණවත් මුදලක් නොමැතිනම් කුමක් සිදුවේද?

හැකි නම්, දේශීය මුදල්, ජාත්‍යන්තර ව ගෙවීම් සිදු කළ හැකි ජංගම දුරකථනයක් සහ ඔබගේ විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක් ගැනීමට උත්සාහ කරන්න (ඔබට වෙනත් රටක පදිංචිය පිළිබඳව හෝ සංක්‍රමණ ලියකියවිලි තිබේ නම් මේවාද රැගෙන යන්න). නමුත් අවශ්‍ය නම් එක්සත් රාජධානියේ ගමන් ලේඛන ප්‍රතිස්ථාපනය කිරීමට අපට උදව් කළ හැකිය. ඔබ මෙම අයිතම ආරක්ෂිතව හා සඟවා ඇති බවට වග බලා ගන්න.

අපට එක්සත් රාජධානියට නැවත පැමිණීම පිළිබඳ විකල්ප ගණනාවක් ගවේෂණය කිරීමට ඔබට උපදෙස් ලබා දිය හැකිය. ඔබගේ නැවත මෙරටට ගෙන්වා ගැනීමේ පිරිවැය පියවා ගැනීමට බලහත්කාර විවාහ ආරක්ෂණ නියෝගයක් ඇතැම් තත්වයන් යටතේ භාවිතා කළ හැකිය.

## මට නැවත එක්සත් රාජධානියට පැමිණීමට කොපමණ කාලයක් ගතවන්නේද සහ ඒ සඳහා විධිවිධාන යෙදෙන අතරතුර මම නැවතී සිටින්නේ කොතැනද?

ඔබට හැකි ඉක්මනින් නැවත පැමිණීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට අපි උත්සාහ කරන්නෙමු. කෙසේ වෙතත්, ඔබට දීර්ඝ කාලයක් විදේශගතව සිටීමට

සිදුවුවහොත්, රැඳී සිටීමට සුදුසු ආරක්ෂිත ස්ථානයක් සොයා ගැනීමට අපි ඔබට උදව් කිරීමට උත්සාහ කරන්නෙමු.

## මා විදේශයක සිටී නම්, මගේ විදේශ ගමන් බලපත්‍රය නොමැති නම් කුමක් සිදුවේද?

ඔබ බ්‍රිතාන්‍ය ජාතිකයෙකු නම්, ඔබගේ අනන්‍යතාවය පිළිබඳව අප සෑහීමකට පත්වූ පසු අපට හදිසි ගමන් ලේඛනයක් නිකුත් කළ හැකිය. ඔබ බ්‍රිතාන්‍ය ජාතිකයෙකු නොවේ නම් බලහත්කාර විවාහ ඒකකය ඔබට උපදෙස් දෙනුයේ නව ගමන් ලියවිල්ලක් ලබා ගැනීම සඳහා උපකාර ලබා ගැනීමට ඔබේ ජාතිය හා සම්බන්ධ ළඟම ඇති තානාපති කාර්යාලය සමඟ සම්බන්ධ වන ලෙසටයි.

## මම විදේශයකදී විවාහ වුණා, මගේ විවාහය එක්සත් රාජධානියේ වලංගු ද?

ඔබගේ විවාහය, සිදු වූ රටෙහි නීත්‍යානුකූලව වලංගු නම්, බොහෝ අවස්ථාවලදී එය එක්සත් රාජධානියේ වලංගු වනු ඇත. ඔබ ආගමික හෝ සිවිල් විවාහයක් කර ඇත්ද යන්න නොසලකා ඔබ සොලිසිටර්වරයකු සමඟ කතා කළ යුතුය. ආගමික දීක්කසාදය එක්සත් රාජධානියේ නීත්‍යානුකූල නොවේ.

## මට වයස අවුරුදු 16 ට අඩු නම් ඔබට මට උදව් කළ හැකිද?

ඔව් අපට පුළුවන්. කරුණාකර ඔබේ විකල්පයන් ගැන කතා කිරීමට උපකාරක සේවාව අමතන්න.

## මම බ්‍රිතාන්‍ය ජාතිකයෙකු නොවේ නම් ඔබට මට උදව් කළ හැකිද?

බලහත්කාරයෙන් විවාහ වීමේ අවදානමක් ඇති එක්සත් රාජධානියේ ඕනෑම කෙනෙකුට බලහත්කාර විවාහ ඒකකයට සහාය සහ උපකාර ලබා දිය හැකි නමුත් අපට කොන්සියුලර් සහාය ලබා දිය හැක්කේ විදේශයන්හි සිටින බ්‍රිතාන්‍ය ජාතිකයින්ට (ද්විත්ව පුරවැසියන් ද ඇතුළුව) පමණකි.

## විවාහය වැළැක්වීම සඳහා මට නීතිමය රැකවරණයක් ලබා ගත හැකිද?

ඔව්. බලහත්කාර විවාහය එක්සත් රාජධානියේ සාපරාධී වරදකි. ඔබට විවාහ වීමට බල කෙරෙන්නේ නම් ඔබට සිවිල් උසාවි සහ/ හෝ අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය හරහා නීතිමය රැකවරණය ලබා ගත හැකිය.

ඔබව ආරක්ෂා කර ගන්නේ කෙසේද යන්න සලකා බැලීමේදී බලහත්කාර විවාහ ආරක්ෂණ නියෝගයක් ලබා ගැනීම සඳහා සිවිල් මාර්ගයක් ගත යුතුද, නැතහොත් පොලිසියට ගොස් අපරාධ අධිකරණය හරහා නඩු පැවරිය යුතුද යන්න හෝ මෙම මාර්ග දෙකම තෝරා ගත හැකිය. ඔබට මේ කිසිවක් නොකර සිටීමටද තෝරාගත හැක. බලහත්කාර විවාහ ඒකකයට ඔබට සියලු විකල්ප ගවේෂණය කිරීමට උපකාර කළ හැකිය.

බලහත්කාර විවාහයක් දැනටමත් සිදුවී ඇත්නම් හා යමෙකු බලහත්කාරයෙන් විවාහ කර ගැනීමක් සිදුවන්නට යන්නේ නම් හෝ බලහත්කාර විවාහ ආරක්ෂණ නියෝග භාවිතා කළ හැකිය. නියෝගයක් උල්ලංඝනය කරන්නේ නම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගත හැකිය. මෙම නියෝග පිළිබඳ වැඩි විස්තර සඳහා ඔබට බලහත්කාර විවාහ ඒකකයට ඇමතීමට හෝ

**Https://www.gov.uk/government/publications/forced-marriage-protection-orders-fl701 වෙත පිවිසීම ඔබට කළ හැකිය**



# උදව් සහ
# සහාය

| | |
|---|---|
| හදිසි අවස්ථාවක පොලීසිය | 999 |
| හදිසි නොවන අවස්ථාවක පොලීසිය | 101 |
| Ashiana Network (ලන්ඩන්) - වයස අවුරුදු 14 ට වැඩි කළු සහ සුළු ජනවාර්ගික කාන්තාවන් සහ ගැහැණු ළමයින් සඳහා විශේෂ රැකවරණය, උපදෙස්, සහාය සහ උපදේශන සේවාව | 0208 539 0427 |
| ළමා උපකාරක සේවය | 0800 1111 |
| Imkaan - කළු සහ සුළුතර කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය ආමන්ත්‍රණය කරන කළු ස්ත්‍රීවාදී සංවිධානය | 020 7842 8525 |
| IKWRO - කාන්තා අයිතිවාසිකම් සංවිධානය (නැගෙනහිර ලන්ඩන්) - මැද පෙරදිග සහ ඇෆ්ගනිස්ථාන කාන්තාවන්ට සහ එක්සත් රාජධානියේ වෙසෙන ගැහැණු ළමයින්ට උපකාර කරයි | 0207 920 6460 |

| | |
|---|---|
| Forward (උතුරු ලන්ඩන්) - කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහි හිංසනය අවසන් කිරීමට අප්‍රිකානු කාන්තා නායකත්වයෙන් යුත් සංවිධානයකි | 0208 960 4000 |
| Freedom Charity | 0845 607 0133 |
| Karma Nirvana 'ගෞරවය' පදනම් කරගත් අපයෝජනය/ බලහත්කාර විවාහ උපකාරක දුරකථන සේවාව | 0800 5999 247 |
| London Black Women's Project | 0208 472 0528 |
| පිරිමි උපදේශක සේවය | 0808 801 0327 |
| ජාතික ගෘහස්ථ අපයෝජන උපකාරක දුරකථන අංකය | 0808 2000 247 |
| Respond - ඉගෙනීමේ දුර්වලතා ඇති පුද්ගලයින් සඳහා | 0207 383 0700 |
| Samaritans | 116123 |
| Shakti Women's Aid (එඩින්බරෝ) | 0131 475 2399 |
| Sharan Project - අපයෝජනය හෝ හිංසනය හේතුවෙන් සේවයෙන් පහකිරීමේ අවදානමට ලක්ව සිටින කාන්තාවන්ට, විශේෂයෙන් දකුණු ආසියානු සම්භවයක් ඇති කාන්තාවන්ට ආධාර සහ උපදෙස් ලබා දෙන පුණ්‍යායතනය. | 0844 504 3231 |
| Shelter - නිවාස උපදෙස් | 0808 800 4444 |
| Southall Black Sisters - උපදෙස්, උපදේශනය සහ වෙනත් සහාය ලබා දෙන සම්පූර්ණයෙන්ම ආසියානු සංවිධානයක් | 0208 571 9595 |
| Stonewall Housing – LGBT නිවාස උපදෙස් | 0207 359 5767 |
| Switchboard LGBT+ උපකාරක සේවය | 0300 330 0630 |
| Throughcare Housing and Support (බර්මින්හැම්) | 0121 554 3920 |
| සැබෑ ගෞරවය | 07480 621711 |